42 වන පිටෙන්

හ්දරියන්ටද, නෑයන්ටද නිතරම දුක සැප බලා ධනයෙන් හා ශ්‍රමයෙන් ඉතා ධාර්මික සිතින් උදව් උපකාර කළ ඉතා විශිෂ්ට ගනයේ විවාහකයන්ය.

එම නිසා දෙමාව්පිය දෙපලගෙන්ම (සැමියා සහ බිරිඳගේ) ආශිර්වාදය හා ඇදහීම මත තමාට ලැබෙන දරුවා ඉතාම වාසනාවන්ත රජයෝග ලබන වේලාවක උපත සිදුවනු ඇත.

එසේ දෙදෙනාම විරසක වී දෙමව්පියන් දෙදෙනාටම නොසලකන විවාහක අයට ලැබෙන දරුවන් ගේ ජන්ම පත්‍ර පරීක්ෂාවේදී ඉතා අවාසනාවන්ත හා දෙමව්පියන්ගේ ආදරය නොලබන දරුවන් බිහිවී ඇතිබව පෙනේ.

මේ නිසා දරුවකු ලබාගැනීමට උත්සාහ කරන යුවලක් විසින් ප්‍රථමව ඉහත කී ඇස් දෙක මෙන් ඔබව රැකදුන් දෙමව්පියන් සැලකීම කළ යුතුයි.

(3) නව විවාහක යුවල විසින් තම නිදන කාමරයේ නිදන යහනාව ඉදිරිපිට ඉතා ප්‍රියකරු දරුවකුගේ ඡායාරූප යක් එල්ලා තැබීම හා දිනපතා නින්දට පෙර හා අලුයම අවදිවූ පසු එය දිහා බලා බලාපොරොත්තු ඇතිකරගත යුතුයි. එවිට දරුපල කඩිනම් වේ.

(4) නව යුවල එකිනෙකාට ආදරයෙන් හා සුහඳව මූල්‍ය කටයුතු බෙදාහදාගෙන හා දුකට සැපයට පිහිටවී සන්සුන් මනසින්, ඉවසීමෙන්, කටයුතු කළ යුතුය. තවද අවශ්‍ය විටදී තම පවුලේ වෛද්‍යවරයා ලවා උපදෙස් ගැනීම හා ප්‍රතිකාර විටින් විට ලබාගත යුතුයි.

(5) දිනපතාම තම නිවස ඉතා පිරිසිදුව තබාගැනීම හා තම එළිමහනද ඉතා පිරිසිදුවට තැබීම ද තමා ගමන් ගන්නා වාහනයද, තම ඇඳුම්පැලඳුම්ද, තම ශරීරයද පිරිසිදුවට තබාගත යුතු අතර දින පතාම පැය 1/2 ක් පමණ නින්දට පෙර තම නිදන කාමරයේ ජනේලය විවෘත කර තැබීමෙන් නිවස තුල තිබෙන අපවිත්‍ර වාතය පිටවී පිරිසිදු වාතය තම නිවසට පැමිණීමෙන් සැපසේ රාත්‍රී නින්දට යන බව යෝගීවරුන් පවසා ඇත. එවිට ඉතා සන්සුන් මනසකින් පින්වන්ත දරුවන් ලැබේ.

((6) ඉතා අමිහිරි ලෙස රූපවාහිනී දැමීම, ශබ්දනගා කථා කිරීම, වාද විවාද, ඉතා උණුසුම් ලෙස හා ඉතා සිසිල් ලෙස වායුසමිකරණය දැමීම හා විශාල වශයෙන් නිවසේ සෑම තැනම ගෘහභාණ්ඩ හා අනෙකනුත් උපකරණ තැබීම ඉතා අගුණයි. ඉන් ලැබෙන දරුවාද මන්ද බුද්ධික දරුවකු බවට පත් වේ.

(7) මීට අමතරව සතියකට වරක්වත් තමා දන්නා හෝ සේවය කරන ස්ථානයේ හෝ රෝහලක හෝ තනි මවකට හෝ වයසක මහලු අයට හෝ ආහාර පාන තමාම පිස, දානය දීම හා ගැබිනි මවුවරුන්ට උදව් කිරීම, කථාකිරීම අවශ්‍ය උපකරණ පරිත්‍යාගය හා ගමන් බිමන් යෑම ඉතාම අවශ්‍යයි. ඉන් දරු ප්‍රසූතියට පහසුවීම, ක්‍රමවේදයන් සහ අදහස් හුවමාරු කිරීමෙන් මානසික හා ශාරීරික ශුභ භාවය ලැබේ.

දැන් අපි බලමු ගැබිනි මවකට හා ගැබ්ගැනීමට අවශ්‍ය ආහාර පාන කෙසේද යන්න...

විශේෂයෙන්ම රුධිරය ඉතාම පිරිසිදු විය යුතුයි. ශරීරයේ හා අස්ථි, මජ්ජ, ධාතු ශක්තිය ද මානසික වර්ධනය ඉතා අවශ්‍යයි. මේ නිසා මෙයට අදාල ආහාර ආයුර්වේදයේ ඉතා විශ්ලේෂණාත්මකව විස්තර කර ඇත.

ප්‍රථමව ගොටුකොළ, කන්කුන්. නිවිති, සාරණ, මුකුණුවැන්න වැනි කොළවර්ග දිනපතාව දිවා ආහාරයට අනෙකුත් ආහාර සමග (එක් වර්ගයක්) ගැනීමෙන් රුධිරයට අවශ්‍ය රතුරුධිරානු වර්ධනය හා යකඩ අඩංගු ශක්තියද ලැබෙයි.

සෑම මාලු වර්ගයක්ම කිරි මිශ්‍රව පිස අනුභවය ශුභයි. මනස වර්ධනය වන මැග්නීසියම්, කැල්සියම් මනස හා සෙල වර්ධනය කර දරුවාගේද මවගේද මානසික සුවය ලබා දෙයි.

සියලුම එළවලු වර්ග තම්බා අනුභවය හා එලවලු මගින් පිළියෙල කළ සුප්වර්ග ආහාරයට ගැනීමේන් අනෙකුත් පදාර්ථ පෝෂණය කරයි.

කුකුල් මස්, එලුමස්, එලු පීකුදු හා චීස්, බටර්, පළතුරු යුෂ වර්ග, පොල්වතුර, තැඹිලි වතුර, අලෝයි වීරා යුෂ, ගස්ලබු,පෙයාස් වැනි ආහාර අනුභවයෙන් අස්ථි වර්ධනය හා හමේ ප්‍රියමනාප බව ඇති කරයි.

දිනපතාම ස්නානය කිරීම අත්‍යවශ්‍යයි. සුදු හඳුන්, කොහොඹ හා කහ මිශ්‍ර සබන් හා හිස් සෝදන ශාකශාර අඩංගු ද්‍රව්‍යවලින් ශරීරය පිරිසිදු කිරීම නිසා හමේ රෝග හා හිසේ රෝග දුරලයි.

මත්පැන්, දුම්පානය හෝ මත්පෙති වැනි අශුභ දෙයින් සැමියා හා බිරිඳ වැලකිය යුතුයි.එවැනි ද්‍රව්‍ය මගින් දරුවා මන්ද බුද්ධික වීම, හමේ රෝග හා ලේවල ඇති වන විෂ ඇතුලු විවිධ රෝග සෑදීමට හැකිය.

හැකි සෑම නිවාඩු කාලයතුල පන්සලට ගොස් බෝධිපූජා කිරීම, බෝධිය අභියස සිට පිරිත් කීම හා භාවනා කීම ඉතා ශුභයි. දරුවා සන්සුන් පිනට ලැදි දරුවෙකු වේ.

විවිධ පෝෂ්‍යදායී ආහාර විවිධ රසයෙන් යුතුව අනුභව කළ යුතුයි. තමාට කැමති ආහාර මිතුරියන්ට දන්වා පිළියෙල කරගෙන ආහාරයට ගැනීම ශුභයි.

දුර ගමන්, උස් ස්ථාන, උස් පාවහන් පැලදීම, ඉතා බර භාණ්ඩ රැගෙන ඒම හා ශරීරයට ඉතා අපහසු ඇදුම් පැලදුම් ඇඳීමෙන් වලකින්න.

මීට අමතරව පිරිත් දේශනා කරන නිවාස, දාන දෙන නිවාස හා පූජනීය ස්ථානවල පෙරහර, උත්සව වැනි දේ සඳහා සහභාගීවීම ඉතා ශුභයි.

ආයුර්වේද වෛද්‍ය හා
ජ්‍යොතිෂ්‍ය විශාරද
**වෛද්‍ය ස්ටැන්ලි**
සිද්ධාර්ථ ජ්‍යොතිෂ්‍ය අසපුව

30 වන පිටෙන්

පෙර කාලයේ රජතුමා අසෙකු පිට නැග ගමන් ගත්තද ,දැන් එම සිරිත අභාවයට ගොස් ඇත.දේවාභරණ පෙරහැරෙන් වැඩම වන්ට පෙරාතුව රැස්ව සිටින ජනතාවගේ වැඳුම්, පිදුම් වෙනුවෙන් ටික වේලාවක් දොරකඩ රැඳෙති. ඒ කාලයේදී නැට්ටුවෝ සිය නැටුම් ප්‍රදර්ශනය කරති. ජනතාවද තම දේව භක්තිය ප්‍රදර්ශනය කිරීමට මෙන් වෙන කිසිම අවස්ථාවක නොසිටි උදයෝගයකින් රැස්ව සිටිති.
පසළොස්වක පොහොයට දින දෙක තුනකට කලින් මෙකී එක් එක් දෙවියන්ගේ රන්දෝළියද පෙරහැරට එකතු වේ.දේවාභ රණ හා රිදී කළයක්ද රන්දෝලියේ තැන්පත් කරන අතර පුර්ණ චන්ද්‍රයා නැගෙත්ම රිදී කළය රැගෙන ගඟට බසින කපුරාළ කළස දියට ඔබා එය ජලයෙන් පුරවා ගෙන පෙරලා දේවාලයට රැගෙන එති. උත්සවය එයින් සමාප්ත වෙයි. ( නොක්ස් දුටු ලක්දිව ,පි. 102 )
1664 වසරේදී රජතුමා විසින් පෙරහැර නගරයේ විදි සංචාරයට අවසර නොදුන් නිසා රජතුමාට එරෙහිව කැරැල්ලක් ඇති විය.එතැන් සිට පෙරහැර තහනමක් නොමැතිව පවත්වා ගෙන යන ලදී.
වෘත්තියෙන් වෛද්‍යවරයෙකු වු ජෝන් ඩේවි එවක ලංකාව පාලනය කළ රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාගේ පෞද්ගලික වෛද්‍යවරයා වූයේය. An Account of interior of Ceylon and its Their inhabitants with Travels in that Island වාර්තාවට 1816 සිට 1820 දක්වා වූ කාලයේ ඔහු විසින් එක්රැස් කර ගත් තොරතුරු ඇතුලත් වේ. මහනුවර ඇසළ පෙරහැර පිලිබඳව මෙම යුගයේ තොරතුරු දැන ගැනීමට බෙහෙවින් හේතු වෙන මෙම වාර්තාව අද දක්වා පෙ රහැරෙහි ගමන් මග දැන හඳුනා ගැණීමට බෙහෙවින් උපකාරි වේ.

## ජෝන් ඩේවි දුටු මහනුවර ඇසළ පෙරහැර

ජෝන් ඩේවි සඳහන් කරන අන්දමට මහනු වර ඇසළ පෙරහැර ජාතික මහෝත්සවයක් ලෙසින් පවත්වා ඇත. නව සඳ පුර පෑල විය දින පෙරහැර ආරම්භ කරනු ලබයි. එවක පැවැති විශ්වාසයන්ට අනුව විෂ්ණු දෙවියන්ගේ උත්පත්තිය සිහිපත් කිරීම මුල් කර ගෙන මෙය පවත්වන ලදැයි අදහස් වේ. අව පෑල දිනයේ මෙම උත්සවය අවසාන වේ.

පුර පෑළවියට දින කීපයකට පෙරාතුව ප්‍රධාන දේවාළ සතරේ මිනිසුන් එක්රැස්ව එල හට නොගන්නා කොස් වියත් තුනක කඳක් ඇති කොස් ගසක් තෝරා ගනිති. මෙයට දුම්මල දුම් සහ සඳුන් දුම් අල්ලා ගස පේ කොට බිම හෙලති. විෂ්ණු දේවාලයේ ගස් කපන්නාට මෙම කාර්යය පැවරෙන අතර ඔහු මෙම කඳ කොටස් හතරකට කපන අතර එක් එක් ලී කැබැල්ල හේවිසි සහිතව දේවාල වෙත ගෙන යනු ලැබේ.

කැප කළ කොස් කඳවී ඒ දේවාල භූමියේ සිටුවා ගොක් සහ මල්වලින් සරසන ලද පැලකින ආවරණය කෙරේ.මෙදින සහ මීළඟ දින තුන තුළ එක් එක් දේවාලයේ කපුරාළවරු දෙවියන්ගේ දුනු හී ගෙන කොස් කඳ වටා මහ පෙරහැරෙන් ගන් කරති. පස් වැනි දිනයේදී නිළමේවරුන් සහ මහජනතාව රැස්ව රන්සිවි ගෙයි තැන්පත් කරන ලද දේවාභරණ හා ධාතුන්වහන්සේ මහ පෙරහැරෙන් වැඩම කරවනු ලබයි. පළමුව ගජනායක නිලමේ සහ රජුගේ අලි ඇතුන් ගමන් කරයි. කොඤ්ඤුතුවක්කු නිලමේ හා කොඤ්ඤුතුවක්කුද , තුවක්කු හා කොඤ්ඤු රැගත් සතර කෝරළ දිසා වේ මිනිසුන්ද,එකී දිසාවේ සහ සුලුනිළධාරින්ද සත් කෝරළ වාසීන්ද, ඌවේ , මාතලේ , සබරගමුව, වලපනේ හා උඩපලාත යනාදි සදිසාවාසින්ද සැරැසී මෙම පෙරහැරට සම්බන්ධ වූහ.එයි න් අනතුරුව ධාතුන් වහන්සේ රැගත් මාලිගාවේ ඇත් පංතියද මොවුන් පසු පස තවත් ඇතුන්ද කුඩ , සේසත් , කොඤ්ඤු , තල අතු , පලිස් , බෙර දවුල් . හොරණෑ සහිත මාලිගාවේ මිනිසුන් හා නැට්ටුවන් පෙරටු කොට ගත් දියවඩන නිළමේද නානායක්කාර නිළමේද , නානායක්කාර ලේකම්ද පෙරහැරේ ගමන් කර තිබේ. නාථ දේවාලයට අයත් කාන්තාවන් විසින් පිරිවරන ලද දෙවියන්ගේ දුනු හී රැගත් නාථ දේවාලයෙ ඇතාද පිරිවර සහිත බස්නායක නිලමේද අනතුරුව පෙරහැරේ ගමන් කළහ. මහා විෂ්ණු දේවාලයේ ඇතාද දුනු හී ගත් මිනිසුන්ද පිරිවර සහිත බස්නායක නිලමේද විෂ්ණු දේවාලය වෙනුවෙන් පෙරහැරට එක් විය. මීළඟට කතරගම දේවාලයේ පෙරහැර සහ පත්තිනි දේවාලයේ පෙරහැරද , දේවාභරණ සහිතව එක් විය. පසුව කොඤ්ඤු සහ තුවක්කු රැගත් සිය ප්‍රධානීන්ට පෙරටුව ගමන් කළ මහ ලේකම් දෙපාර්තමේන්තුවේ මිනිසුන්ද ,මුලින් සඳහන් අතපත්තු දෙපාර්තමේන්තුවේ මිනිසුන්ද . අතපත්තු ලේකම් සහ උඩුනුවර , යටිනුවර , තුම්පනේ , හාරිස්පත්තුව , දුම්බර , හේවාහැට යන රටේ මහත්වරුන්ද සෙසු දෙපාර්තමේන්තු සහ පඤ්ඤකාර මිනිසුන්ද ,එක් එක් ලේකම් සහ සුලු මුලාදෑණීන්ද ඔවුන්ගේ පිරිවරද පෙරහැරේ පසු පසින් ගමන් කළහ.

මෙම පෙරහැර පිට පිටම පස් දිනක් වරක් පස්වරුවේද , තවත් වරක් රාත්‍රියේද බැගින් ප්‍රධාන විති සතර දිගේද , නාථ දේවාලය වටාද ගමන් කලේය. නමුත් දන්ත ධාතුන් වහන්සේ පෙරහැරේ වැඩම නොකරන ලදී. දින පහක් ගෙවුන විට රන්දෝලිබෑම සිදුවේ.එක් එක් දෙවිදුව වෙනුවෙන් කැප කර ලද රන් කළය හා කඩුව බැගින් විය. පස්වරුවේ දේවාභරණ රැගත් ඇතුන් පසු පස දෝලා ගෙන යන ලදී.රාත්‍රියේ දෝලා ගෙන ගියේ ඇතුන්ට පෙරටුවය.රන්දෝලි බෑම සිදු වෙන පස් දිනයන්හි රජතුමා අසුන් අට දෙනෙකු විසින් අදින ලද රන්මුවා රියක නැග සවස් කාලයේ පෙරහැරේ ගමන් කොට ඇත.පුර පසළොස්ක පොහෝ දින රාත්‍රි පෙරහැරට ධාතුන් වහන්සේ එක් කරන අතර එදින පෙරහැරෙන් පසුව ධාතුන් වහන්සේ මහනුවර අස්ගිරි විහාරයේ තැන් පත් රනු ලබයි.

එදින රාත්‍රියේ දේවාල පෙරහැරට ආහාර පුජා පවත්වයි. නැවත පෙරහැර මහවැලි ගඟ දෙසට ගමන් කරයි. සරසන ලද ඔරුව ක් පෙරහැර එන තෙක් ගන්නොරුව තොටු පොලේ රඳවා ඇත.සතර දේවාල කපුරාළ වරුන් සතර දෙනා අතවැසියන් සතර දෙනෙකු සමග රන් කළ සහ කඩු රැගෙන සරසන ලද ඔරුවේ නැග ගඟ ඉහළ යාත්‍රා කොට අරුනෝදය සමග කපුරාළ පෙර වර්ෂයේ දිය කළ හිස් කොට රන් කඩුවෙන් දිය කපා එසැනින්ම එතැනින් ජලය පුරවා ගනු ලැබේ.

පෙරහැර අස්ගිරි විහාරයට පෙරලා පැමිණෙන අතර ධාතුන් වහන්සේ පෙරටු කර ගත් රජතුමා , අමාත්‍යවරුන්ද පැන්තොටට ගිය පෙරහැරට සහභාගි නොවූ සියළුම නිලමේවරුන් පෙරහැරට එක්ව නුවරට සැපැත් වීමෙන් ඇසල පෙරහැර උත්සවයේ මෙම වාරයේ චාරිත්‍රයන් සමාප්තිය දකී.

මුලාශ්‍ර:
ඩේවි දුටු ලංකාව
නොක්ස් දුටු ලක්දිව